# ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ආරක්ෂක සේවයේ දුම්රිය ආරක්ෂක (පිරිමි/ කාන්තා) - III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත ලිඛිත තරග විභාගය - 2026

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ආරක්ෂක සේවයේ දුම්රිය ආරක්ෂක (පිරිමි) තනතුරේ පුරප්පාඩු 239 ක් හා දුම්රිය ආරක්ෂක (කාන්තා) තනතුරේ පුරප්පාඩු 17 ක් සඳහා බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1) මෙමගින් බඳවා ගැනීම් සිදු කරනුයේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ආරක්ෂක සේවයේ දුම්රිය ආරක්ෂක (පිරිමි/ කාන්තා) තනතුර සඳහා වේ.

2) අයදුම්පත් කැඳවන අවසාන දිනය - 2026.09.28

***සටහන -***

1. අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපැලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය දක්වා අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද

කිරීමෙන් සිදුවිය හැකි අගතිය පිළිබඳව ගැටලු අයදුම්කරුවන් විඳදරාගත යුතු ය.

2. ඉදිරිපත් වන සියලු අයදුම්කරුවන් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇතිය යන පූර්ව උපකල්පනය මත ඉදිරි පියවර සඳහා යොමු වන බැවින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට හෝ ලිඛිත පරීක්ෂණයට යොමු වීම අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීමක් ලෙස සලකා නොබලන බව අවධාරණයට යටත් කර ගත යුතු ය.

**1.1 යෝග්‍යතාවය ඇගයීමේ මූලික පරීක්ෂණය හා සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය-**

සියලු අයදුම්කරුවන් මෙම පරීක්ෂණය සඳහා යොමු කරවන අතර එයට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් 50% ක් හෝ ඊට ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා වූ අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයට යොමු කරනු ලැබේ.

| ක්‍රියාකාරකම | කාලය | ලකුණු |
|---|---|---|
| දුර දිවීමේ මීටර /Run meters 1000 | විනාඩි 03 ට අඩු නම් | 30 |
| | විනාඩි 03 ත් 04 ත් අතර | 20 |
| | විනාඩි 04 ත් 05 ත් අතර | 10 |
| | විනාඩි 05 ට වැඩි නම් | අසමත් |
| Chinup (වාර 05 ක්) | විනාඩි 01 යි | එක් වාරයකට ලකුණු 03 බැගින් උපරිම ලකුණු 15 කි |
| Pushup (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Situp (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Squat Thrust (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Kim Gem (මතකය පරීක්ෂා කිරීම) | අයිතමයන් නිරීක්ෂණය කිරීම සඳහා තත්පර 30 යි ධාරණය කර ගැනීමට තත්පර 30 යි ලිවීමට තත්පර 120 යි | එක් අයිතමයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 10 |

දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන මූලික පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය. අයදුම්කරුවන් විසින් මූලික පරීක්ෂණයට මුහුණ දීමට නුසුදුසු නොවන බවට කැඳවීම් ලිපිය සමගඅමුණා එවනු ලබන පෝරමය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගේ නිර්දේශය සහිතව එම අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු ය.

**1.2 ලිඛිත විභාගය -**

එම යෝග්‍යතාවය ඇගයීමේ මූලික පරීක්ෂණයෙන් පසු මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. තම අයදුම්පතේ භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට අයදුම්කරුට ඉඩදෙනු නොලැබේ.

1) බුද්ධි පරීක්ෂණය
2) භාෂාව හැකියාව

**1.3 යෝග්‍යතාවය ඇගයීමේ මූලික පරීක්ෂණය හා ලිඛිත විභාගය පවත්වන දින -**

යෝග්‍යතාවය ඇගයීමේ මූලික පරීක්ෂණය හා මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමට දුම්රිය සාමාන්‍යාධිකාරීට බලය ඇත.

**02.** පුරප්පාඩු සංඛ්‍යාව 256 කි (දුම්රිය ආරක්ෂක - පිරිමි 239 ක් හා කාන්තා 17 ක් වශයෙන්). අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම

පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 92 වැනි වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

**03. සේවා කොන්දේසි :-**

3.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලට ද, දුම්රිය ආරක්ෂක සේවයේ බඳවා ගැනීම් පරිපාටියෙහි පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම පරිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධන වලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධාන වලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ විධිවිධාන වලට ද, යටත්ව තෝරා ගනු ලබන අයදුම්කරුවකු ආරක්ෂක තනතුරට පත්කරනු ලැබේ.

3.2 මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිය තීරණයකට යටත්විය යුතු ය.

3.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ආරක්ෂක සේවයේ දුම්රිය ආරක්ෂක තනතුරට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

3.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 18/ 2020 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැදී වසර 05 ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

3.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරී නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හෝ පත්කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට දුම්රිය සාමාන්‍යාධිකාරීට බලය ඇත.

**04. මාසික වැටුප් පරිමාණය**

2025.03.25 දිනැති 10/2025 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය (RS 1-2025) රු. 49, 550 - 7 X 540 - 27 X 670 - 71,420 /- වේ. එනම් රු. 49, 550 /- ආරම්භක වැටුප් තලයෙහි පිහිටවනු ලැබේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

**05. බඳවා ගැනීමේ සුදුසුකම් :**

(අ) **කායික සුදුසුකම් -**

(i) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(ii) උස (පාවහන් නොමැතිව)
- පිරිමි අයදුම්කරුවන් සඳහා අඩි 05 යි අඟල් 06 ක් තිබිය යුතුය. (5’ 6”)
- කාන්තා අයදුම්කරුවන් සඳහා අඩි 05 යි අඟල් 02 ක් තිබිය යුතු ය. (5’ 2”)

(iii) ඇස් පෙනීම :- ඇස් කණනාඩි නොමැතිව “ඒ “ 2 දෘෂ්ටී ප්‍රමාණයක් තිබිය යුතු ය. (මෙය එල්.බී. 29 අක්ෂි දෘෂ්ටී පරීක්ෂණයෙන් සමත් වීමට යටත්වය)

(iv) පිරිමි අයදුම්කරුවන් සඳහා පපුව අඟල් 32 ක් තිබිය යුතු ය.

(ආ) **අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව විෂයන් හයක් (06) සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව සමත් වී තිබීම.

(ඇ) **වයස:**

2026.09.28 දිනට අවම වයස් සීමාව අවුරුදු 18 නොඅඩු විය යුතු අතර උපරිම වයස් සීමාව අවුරුදු 28 නොවැඩි විය යුතුය. (ඒ අනුව 2008.09.28 දිනට හෝ ඊට පෙර හා 1997.09.29 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසු කම් ඇත.)

(ඇ) **වෙනත් -**

(i) ශ්‍රී ලංකික පුරවැසියෙකු විය යුතු ය.
(ii) සියළුම අයදුම්කරුවන් අවිවාහක විය යුතු ය.
(iii) විශිෂ්ට චරිතයකින් යුක්ත වීම
(iv) කුමන හෝ ආගමක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම තරග විභාගයට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට හෝ අවසර නොමැත.
(v) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත දක්වා ඇති සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**06. විභාග ගාස්තු:**

විභාග ගාස්තුව රු. 1200.00 කි. මෙම මුදල අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර දුම්රිය සාමාන්‍යාධිකාරීගේ මහජන බැංකු නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176-100129027-313 ට බැරවෙන පරිදි ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට් පත අයදුම්පතේ අදාල කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය.(රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

**07. අයදුම් කිරීමේ ක්‍රමය**

අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය භාවිත කරමින් ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක, අයදුම්පතේ ශීර්ෂ අංක 1.0 සිට 6.0 තෙක් පළවන පිටුවට ද, 7.0 සිට 12 (i) තෙක් එහි දෙවන පිටුවට ද, 12 (ii) සිට 14 (ඇ) තෙක් එහි තුන්වන පිටුවට ද, ඉතිරිය අනෙකුත් පිටුවලට ද වන පරිද්දෙන් තම අයදුම්පත සකස්කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/ යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිත කළ හැකිය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත් යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේද ? යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත් කොට ලදුපත අලවා ඇද්ද යන්න පිළිබඳව නැවත විමසිලිමත් විය යුතුය. තවද මේ පූර්ණ කරන ලද අයදුම්පතේ ජායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ජායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

(අ) අයදුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යාවශ්‍ය වේ.

(ආ) විභාගය සඳහා වන නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් 2026.09.28 දින හෝ ඊට පෙර හෝ ලැබෙනු පිණිස එවිය යුතුය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ, වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව "ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ආරක්ෂක සේවයේ දුම්රිය ආරක්ෂක (පිරිමි/කාන්තා) තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026" යනුවෙන් ලිවිය යුතු ය. එදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.

**දුම්රිය සාමාන්‍යාධිකාරී,**
**පත්වීම් ශාඛාව,**
**දුම්රිය මූලස්ථානය,**
**ඕල්කට් මාවත,**
**තැ.පෙ. 355,**
**කොළඹ 10.**

(ඇ) අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශපත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

(ඈ) අඩුපාඩු සහිත අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(ඉ) අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ.

අයදුම්කරුවන් වෙත ලිඛිත විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත් පත් වල හා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිළ වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුනි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේදී අයදුම් කළ විභාගයේ නම් අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමඟ ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සටහන් කොට ඉල්ලීම් ලිපියක් නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය මඟින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායි වනු ඇත. තව ද, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත් තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානම්ව තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

**08. විභාගයට පෙනී සිටීම -**

(අ) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අයදුම්කරුවකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවා ගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. සෑම අයදුම්කරුවකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම ගැසට් පත්‍රය ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අයදුම්කරුවන් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදුවනු ඇත.

සටහන - අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

**09. අයදුම්කරුවන්ගේ අනන්‍යතාව -**

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අයදුම්කරුවකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍රයක් පමණක් පිළිගනු ඇත.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

**10. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් -**

අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

**11.** මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් වලට යටත්ව ලේකම් විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

**12. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය -**

(අ) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.
(ආ) අයදුම්කරු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ අධ්‍යාපන සුදුසුකම් ලබාගත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විය යුතු ය.

*සටහන :* (i) ඉහත (ආ) හි ඇති සුදුසුකම් යන පදයෙන් අදහස් කෙරෙන්නේ 5 (ආ) ඡේදයේ ඇති අධ්‍යාපන සුදුසුකම වේ.

(ii) අයදුම්කරුවකු විභාගයේ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකට ම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(iii) තම අයදුම්පතෙහි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අයදුම්කරුවකුට ඉඩ දෙනු නොලැබේ.

**13. බඳවා ගැනීමේ ක්‍රමය :-**

**13.1 ලිඛිත විභාගය**

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර දෙක (02) කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයයන් සහ එක් එක් විෂය සමත් වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| *විෂයය* | *ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | 100 | 50 |
| 02. භාෂාව හැකියාව | 100 | 50 |

අයදුම්කරුවන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු ය.

**13.2 ලිඛිත විභාගයේ විෂය නිර්දේශය**

01. බුද්ධි පරීක්ෂණය

තර්කානුකූල විචාර බුද්ධිය, ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව, සංඛ්‍යාමය ගැටළු, ගණිත

ගැටළු, භාෂා ඛණ්ඩ, වගු, ගැලීම් සටහන්, පින්තූර හා ප්‍රස්ථාර උපයෝගී කර ගනිමින් බහුවරණ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. (කාලය පැය 01 යි)

02. භාෂා හැකියාව

නිවැරදිව හා පැහැදිලිව අදහස් ගොනු කිරීමේ හැකියාව, වර්තා ලිවීමේ හැකියාව, නිවැරදි ව්‍යාකරණ භාවිතය, තේරුම් ගැනීමේ හැකියාව හා කාර්යාලීය ලිපි ගණුදෙනු කිරීමේ හැකියාව මැන බැලීමේ ආකාරයෙන් සැකසුනු කෙටි පිළිතුරු සැපයීම, රචනා හා ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. (කාලය පැය 02යි)

**13.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

ලිඛිත විභාගයේ විෂයයන් දෙකෙන් එක් එක් විෂයට වෙන වෙනම ලකුණු 50% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ ඉහලම කුසලතා අනු පිළිවෙළට අවශ්‍ය සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට යොමු කරනු ඇත. ලිඛිත විභාගයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු වල එකතුවේ වැඩිම ලකුණු අනු පිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පහත සඳහන් පරිපාටිය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබා ගත හැකි උපරිම ලකුණු පනහ (50) කි.

| *අනු අංකය* | *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ. |
| 02 | නායකත්ව හා වෙනත් ප්‍රජා සේවාවන් | 20 | |
| 03 | ක්‍රීඩා කුසලතා | 30 | |
| 04 | භාෂා දැනුම හා තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම | 25 | |
| 05 | සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වනු ලබන කුසලතාවය | 05 | |
| | මුළු ලකුණු | **100** | |

**13.4 එහි විස්තරාත්මක ලකුණු ලබා දීමේ පරිපාටිය පහත පරිදි වේ.**

**(i) අතිරේක අධයාපන සුදුසුකම් (ලකුණු 20)**

නියමිත අධ්‍යාපන සුදුසුකමට වැඩි අධ්‍යාපන සුදුසුකම් සඳහා උපරිම ලකුණු 20 කි.

1. පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගෞරව උපාධියක් ලබා තිබීම - ලකුණු 20
2. පිළිගත් විශ්ව විද්‍යාලයකින් සාමාන්‍ය උපාධියක් ලබා තිබීම - ලකුණු 15
3. ඕනෑම විෂය ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් NVQ 04 හෝ ඊට ඉහළ සහතිකයක් ලබා තිබීම - ලකුණු 10
4. අ.පො.ස. (උ/පෙළ) විෂයයන් 03 ක් සමත්ව තිබීම - ලකුණු 05

**(ii) නායකත්ව හා වෙනත් ප්‍රජා සේවාවන් (ලකුණු 20)**

**(iii) ක්‍රීඩා කුසලතා**

**ක්‍රිකට් රගර් බොක්සිං, කරාටේ, ජිම්නාස්ටික්, මලල ක්‍රීඩා, ක්‍රීඩා වලදී ලබා ඇති දක්ෂතා හෝ ශිෂ්‍ය භට පුහුණුව පිළිබඳ සහතිකයක් තිබීම යන දෙකෙන් එක් කරුණකට පමණක් උපරිම ලකුණු 15 ක් ප්‍රදානය කෙරේ.**

| | | |
|---|---|---|
| ජාතික මට්ටමේ ප්‍රථම ස්ථානය | - | ලකුණු 30 |
| දිස්ත්‍රික් මට්ටමේ ප්‍රථම ස්ථානය | - | ලකුණු 30 |
| ප්‍රාදේශීය මට්ටමේ ප්‍රථම ස්ථානය | - | ලකුණු 10 |
| වෙනත් සහතික | - | ලකුණු 05 |

දෙවන හා තෙවන ස්ථාන වෙනුවෙන් අනුපාතිකව ලකුණු ලබා දෙනු ලැබේ.

**(iv) භාෂා දැනුම හා තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම (ලකුණු 25)**

**මෙම තරඟ විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබන ඉහත අනු අංක 05 හි (ආ) යටතේ සඳහන් භාෂා මාධ්‍යට අමතරව එහි සඳහන් අනිකුත් භාෂා මාධ්‍යයන් සඳහා අයදුම්කරු විසින් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කරන සහතික සඳහා එක් භාෂාවකට ලකුණු 05 ක් වන සේ භාෂා දෙකම සඳහා ලකුණු 10 ක උපරිමයට යටත්ව ලකුණු ප්‍රදානය කෙරේ.**

**(iv) සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය (ලකුණු 05)**

***සැලකිය යුතුයි:-*** සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම, පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

**13.5** විභාගයට පෙනී සිටි සියලු අයදුම්කරුවන් වෙත පෞද්ගලික ප්‍රතිඵල දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිල වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමට හෝ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පියවර ගනු ඇත.

**14.** සිංහල, දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**රවීන්ද්‍ර පත්මප්‍රිය,**
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2026 අගෝස්තු මස 11 වැනි දින,
දුම්රිය සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
තැ.පෙ. 355,
ඕල්කට් මාවත,
කොළඹ 10.

(මේ අනුව A-4 කඩදාසිවල දෙපසම භාවිත කරමින් පිළියෙල කරගත් අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයදුම්පත් කැඳවීමේ නිවේදනය කියවා හොඳින් වටහා ගත යුතු ය.)

**ආදර්ශ අයදුම්පත**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ආරක්ෂක සේවයේ දුම්රිය ආරක්ෂක (පිරිමි/ කාන්තා) තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026**

**Open Competitive Examination for Recruitment to Railway Security (Male/ Female) of Railway Security Service in Sri Lanka Railway Department - 2026**

1.0 මාධ්‍ය
විභාගය සඳහා ඉල්ලුම් කරන මාධ්‍ය
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

02. සම්පූර්ණ නම :
   i. සිංහලෙන් /දෙමළෙන් : ________________________
   ii. ඉංග්‍රීසිකැපිටල් අකුරින්:________________________
   (උදා:HERATH MUDIYANSELAGE PIYAL SILVA)

03. මුලකුරු සමග නම :
   i. සිංහලෙන් /දෙමළෙන් : ________________________
   ii. ඉංග්‍රීසියෙන් :________________________

04. ස්ථිර ලිපිනය :
   i. සිංහලෙන් /දෙමළෙන් : ________________________
   ii. ඉංග්‍රීසියෙන් : ________________________

05. දුරකථන අංකය :
   I. ජංගම දුරකථන අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

   II. කාර්යාලීය දුරකථනඅංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

06. ජාතික හැඳුනුම්පත් අංකය:

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

07. ස්ත්‍රී /පුරුෂ භාවය :

ස්ත්‍රී 1
පුරුෂ 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

08. විවාහක/ අවිවාහක බව :

අවිවාහක 1
විවාහක 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

09. පදිංචිය :

   i. ග්‍රාම නිලධාරී කොට්ඨාසය : __________ එහි අංකය :
   ii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : __________
   iii. දිස්ත්‍රික්කය:__________

10. උපන් දිනය : වර්ෂය : [ | | | | ] මාසය : [ | ] දිනය : [ | ]

2026.09.28 දිනට වයස : අවු: [ | ] මාස : [ | ] දින: [ | ]

11. දැනට සේවය කරන ආයතනය/දෙපාර්තමේන්තුව : ________________________

12. අධ්‍යාපන සුදුසුකම් :

i. අ.පො.ස. (සා.පෙළ) - පළමුවර
විභාග අංකය : ______________ වර්ෂය : ________

| අනු. අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| I. | | |
| II. | | |
| III. | | |
| IV. | | |
| V. | | |

| අනු. අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| VI. | | |
| VII. | | |
| VII. | | |
| IX. | | |
| X. | | |

ii. අ.පො.ස. (සා.පෙළ) - දෙවනවර

විභාග අංකය : ______________ වර්ෂය : ________

| අනු. අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| I. | | |
| II. | | |
| III. | | |
| IV. | | |
| V. | | |

| අනු. අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| VI. | | |
| VII. | | |
| VII. | | |
| IX. | | |
| X. | | |

13. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?:
(අදාළ කොටුව තුළ "×" ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

14. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සහ /හෝ අසත්‍ය ලෙස සම්පූර්ණ කර තිබීමෙන් අපේක්ෂකත්වය අවලංගු වන බව හා තනතුර සඳහා තෝරා ගැනීමෙන් පසු ඉහත කරුණු අනාවරණය වුවහොත් තනතුර සඳහා කරන ලද පත්වීම අවලංගු වන බව හොඳින් දැන සිටිමි. ඉන් වන හානිය මම පුද්ගලිකව දරා ගනිමි.

(ආ) ඉහත (අ) හි දක්වා ඇති කරුණු අසත්‍ය බව මා තනතුරට පත්වීමෙන් පසුව හෙළි වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් බව ද ප්‍රකාශ කරමි. ඉන් සිදුවන හානි වෙතොත් ඒවා ද මම පුද්ගලිකව දරා ගනිමි.

(ඈ) ................................ දින ...................................................... බැංකුවේ.................... ශාඛාවට රු.1200/=ක් ගෙවා ලබා ගත් මුදල් බැරපතෙහි මුල් පිටපත මේ සමඟ අමුණා ඇත.

| |
|---|
| බැරපත එහි එක්දාරයකින් නොගැලවෙන සේ අලවන්න<br>(බැරපතෙහි ඡායා පිටපතක් ලඟ තබා ගන්න.) |

(ඇ) මෙම විභාගයේ කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි.

(ඉ) තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

__________________,
අයදුම්කරුගේ අත්සන.

දිනය - ___________

15. අත්සන සහතික කිරීම :
මෙම අයදුම්පත ඉදිරිපත් කරන.......................................................................................................... මහතා/මෙනවිය මම පුද්ගලිකව හඳුනමි. ඔහු ............................ දින ඉහත අත්සන මා ඉදිරිපිට දී තැබූ බව ද නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම බැරපත අලවා ඇති බවත් සහතික කරමි.

______________,
සහතික කරන අයගේ අත්සන.

දිනය : ___________

සහතික කරන අයගේ සම්පූර්ණ නම : _______________________________________
තනතුර : ______________________
ලිපිනය : ________________________________________________________________
(කරුණාකර නිල මුද්‍රාව තබන්න).

16. දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ සහතිකය:

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ..............................................................................................මහතා /මෙන විය..................…………...................................................................දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ...................................... දින සිට ……………..………………………………දින දක්වා ....................................................................වශයෙන් සේවය කර ඇත. ඔහුට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී නැත/ඇත. ඔහුගේ වැඩ,හැසිරීම හා පැමිණීම සතුටුදායකය/ අසතුටුදායකය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත් ,එම ලදුපත අලවා ඇති බවත් , ඔහු දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ආරක්ෂක සේවයේ දුම්රිය ආරක්ෂක (පිරිමි/ කාන්තා) III ශ්‍රේණිය සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන් / ආයතනයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බවත් දන්වනු කැමැත්තෙමි.(අදාළ නොවන වචන කපා හරින්න)

___________________,
දෙපාර්තමේන්තු/ආයතන
ප්‍රධානියාගේ අත්සන.

දිනය : _________________
සහතික කරන අයගේ සම්පූර්ණ නම : _______________________________________
තනතුර : ______________________
ලිපිනය : ________________________________________________________________
(කරුණාකර නිල මුද්‍රාව තබන්න.)

08 - 310